සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DDD/HO/08/PM/03-01 Ac.Pl.2018 | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2018.08.24 |

**සමෘද්ධි චක්‍රලේඛ අංක :- 2018/15**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

**2019 වසර සඳහා ග්‍රාමීය මට්ටමේ ප්‍රජා සහභාගීත්වය ශක්තිමත් කිරිමේ ක්‍රමෝපායික සැලසුම් සකස් කිරීම.**

**1. හැඳින්වීම**

ශ්‍රී ලංකාව වසර 2030 වන විට තිරසර සංවර්ධන ඉලක්ක වෙත ළඟා වීම උදෙසා අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ මාර්ගෝපදේශකත්වයෙන් මේ වන විට රජය විසින් වැදගත් පියවරයන් කිහිපයක්ම ගෙන ඇත. 2030 වන විට **"දිළිඳු බවින් තොර ශ්‍රී ලංකාවක්"** තිරසර ඉලක්කය අත්පත් කර ගැනීම සඳහා ක්‍රමෝපායික සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීම සඳහා ලංකාවේ දිළිඳුකම පිටුදැකීම පිළිබඳ ප්‍රධාන උපායමාර්ගික සමෘද්ධි සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරුණු ප්‍රධාන වගකීම වේ.

තවද, **"විවෘත රාජ්‍ය ප්‍රතිපත්තිය (Open Government Policy)"** ක්‍රියාත්මක කිරීමේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව කටයුතු කරන බැවින් යථෝක්ත ප්‍රතිපත්තිය තහවුරු කිරීම සඳහා සැලසුම් සකස් කිරීමේ දී **"ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීමේ ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපනය කිරීම"** අරමුණු කරගෙන 2019 වර්ෂයට සමෘද්ධි ප්‍රතිලාභීන් ඇතුලු අඩුආදම්ලාභීන් සවිබලගැන්වීම උදෙසා වන උපායමාර්ගික සැලසුමක් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් සකස් කිරීමට තීරණය කර ඇත.

මෙහි දී පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කිරීමට බලාපොරොත්තු වේ.

(අ) ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය
(ආ) ආර්ථික හා ජීවනෝපාය සංවර්ධනය
(ඇ) සංස්කෘතික හා සමාජ සංවර්ධනය


1 වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**2. ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම**

ඒ අනුව එකී ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම මෙහි මතු දැක්වෙන පියවරයන් සහ කාල රාමුවක් තුළ ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ.

මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ මැදිහත්වීම හා මගපෙන්වීම යටතේ මූලස්ථාන කළමණාකරුවන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දී සෑම ග්‍රාම නිලධාරී වසමක්ම නියෝජනය වන ආකාරයට ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් යෝජිත සැලැස්ම සකස් කිරීමට පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අදාල සැලැස්ම සකස් කිරීමට භාවිතා කළ යුතු ආකෘතිය මේ සමඟ අමුණා ඇති අතර, එම තොරතුරු ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ලබාගෙන හා ඒකරාශි කොට අදාල වාර්තාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් දිස්ත්‍රික් වාර්තාව ඉදිරිපත් කළ යුතුය.

මෙම වැඩසටහන මගින් සමෘද්ධි ප්‍රතිලාභීන් / අඩු ආදායම්ලාභී පවුල් සමාජ, ආර්ථික හා සංස්කෘතිමය වශයෙන් සවිබලගැන්වීම උදෙසා ඔවුන්ගේ ද අදහස් ලබාගෙන 2019 වර්ෂයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සකස් කිරීමට යෝජිත උපායමාර්ගික සැලැස්ම පිළියෙල කර ගැනීමට ඔබගේ උපරිම සහයෝගය ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

අදාල කාර්යය කඩිනමින් දිවයින පුරා එක්වර ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කාල වකවානු අනුව කටයුතු කිරීමට ඔබගේ අවධානය යොමුවන්නේනම් මැනවි.

| අ.අ | කාර්යය | ස්ථානය | කාර්යය ඉටු කිරීමට යෝජිත දිනය | සංවිධානය කිරීම සඳහා වගකිවයුතු නිලධාරී |
|---|---|---|---|---|
| 01 | මූලික සාකච්ඡාවකින් ග්‍රාමසේවා වසම් මට්ටමින් සැලසුම් කමිටුවක් පත් කර ගැනීම.<br>උදාහරණ : සමෘද්ධි සංවර්ධන නිලධාරී / ආර්ථික සංවර්ධන නිලධාරී / ග්‍රාම නිලධාරී / ප්‍රජාමූල සංවිධාන සභාපති | ක්ෂුද්‍ර මූල්‍ය බැංකුව | 2018.08.30 | මූලස්ථාන කළමණාකරු |
| 02 | සමෘද්ධිලාභීන්, අඩු ආදයම්ලාභී පවුල් හා ප්‍රජා මූල සංවිධාන නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් වැඩමුළුවක් තුලින් ග්‍රාම සේවා කොට්ඨාස මට්ටමින් සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනා ගැනීම, සැලැස්ම පිළියෙල කිරීම සහ ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීම. | ග්‍රාම නිලධාරී වසමේ පොදු ස්ථානයක | 2018.09.05 | අදාල ග්‍රාම නිලධාරී වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී / ග්‍රාම නිලධාරී / ආර්ථික සංවර්ධන නිලධාරී |
| 03 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වන සැලැස්ම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීම | | 2018.09.17 | ප්‍රාදේශීය ලේකම් |

| | | | | |
|---|---|---|---|---|
| 04 | දිස්ත්‍රික් මට්ටමින් වන සැලැස්ම කෙටුම්පත් කර අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම | | 2018.09.25 | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ |

මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ඔබගේ ප්‍රමුඛ අවධානය යොමුවන්නේනම් මැනවි.

**ජේ.දඩල්ලගේ**
**අධ්‍යක්ෂ ජනරාල්**

පිටපත් : -

01. ගරු පී. හැරිසන් මැතිතුමා, සමාජ සවිබලගැන්වීම් අමාත්‍ය - කරු. දැ.ගැ.ස.
02. ලේකම්, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
03. දිස්ත්‍රික් ලේකම්, ........................................... - අ.ක.ස.
04. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, ..................................... - අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කොට දිස්ත්‍රික් සැලැස්ම කඩිනමින් ඉදිරිපත් කිරීම සඳහා

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) | ප්‍රධාන ගණකාධිකාරී | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) | කාර්යාලය |
| பணிப்பாளர் தலைமையதிபதி | பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) | பிரதான கணக்காளர் | பணிப்பாளர் (குறு நிதி ) | அலுவலகம் |
| Director General | Director (Admin & Establishment) | Chief Accountant | Director ( Micro Finance) | Office |
| - 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| - 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| mail dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | **Hot Line :0112-889007** | | | |